Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

"ආදරණීය දුවේ පුතේ,"

පහත සඳහන් ගීතය තාලයට රස විඳිමින් ගායනා කරන්න .චිත්‍රයක් අඳින්න.

**ඉරෙන් හඳෙන්**

ඉරෙන් හඳෙන් එළිය අරන් - ගහෙන් වැලෙන් සුවඳ අරන්
ඇළෙන් දොළෙන් සිසිල අරන්
අපට සැදුණු අපේ ලෝකයේ - සතුටු වෙන්න එන්න යාළුවේ //
සමනල තටු සිඳින්නෙපා - පාට මැකී යයි දේදුන්නේ
ගහවැල සිඳ දමන්නෙපා - පොළොව දැවී යයි ඉර ගින්නේ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට සදා රකිමු යාළුවේ //
නටා ගයන බටිති මලිත්තෝ - අපා දෙපා සිවුපා ඇත්තෝ
ඉරේ හඳේ ගහේ වැලේ - අපි වගේ ම උරුමය ඇත්තෝ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට බෙදා ගනිමු යාළුවේ //
පද රචනය - ආචාර්ය සෝමරත්න දිසානායක

සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - විශාරද හර්ෂණ දිසානායක
'සූරිය අරණ 'චිත්‍රපටය

- පහත දැක්වෙන කතාව කියවා රසඳින්න

**වලාකුළු යාළුවෝ**

ගස්වැල්වලින් පිරුණු ලොකු කැලෑවක් තිබුණා. මේ කැලෑව හරි ම ලස්සන යි. වෙනත් තැන්වල ඉඳලත් කුරුල්ලෝ, සමනල්ලු මේ කැලෑවට එනවා. ඒ අය එන්නේ කැලෑවේ ලස්සන මල්වල පැණි බොන්න, පැණි පිරුණු පලතුරු කන්න. සත්තු එනවට ගස්වැල් ගොඩක් සතුටු වුණා. මෙහෙම කාලයක් හැම දෙනා ම සතුටින් ඉන්න අතරෙ කැලෑවට වැස්ස අඩු වුණා. මල් පිපෙන එකත්, පලතුරු හැදෙන එකත් ටික ටික අඩු වුණා. මේ හින්දා කුරුල්ලෝ, සමනල්ලු කැලෑවට ආවෙත් නැහැ. මේ ගැන ගස්වැල් හරියට දුක් වුණා. වැස්සක් වහින්න කළු වලාකුළු අහසට එනවද කියලා, ගස්වැල් හැමදා ම දුකෙන් අහස දිහා බලාගෙන හිටියා. ගස්වැල්වලට අහස දිහා බලා ඉන්න බැරි තරමට උණුසුමක් දැනුණා. සමහර ගස්වල කොළත් හැලිලා. මේ නිසා පුංචි ගස්වලට සෙවණත් නැති වුණා. ලොකු ගස් බලාගෙන ඉන්න අතරෙ පුංචි ගස් මැලවුණා. ලොකු ගස්වලට හරි ම දුක යි. දුක වැඩි නිසා ම අහසට ඇහෙන්න තරම් හයියෙන් කෑගැසුවා. කෑගහන්නේ කවුද කියලා අහසේ පාවුණ සුදු වලාකුළු සෝදිසි කර බැලුවා. වලාකුළු දැක්කා කෑගහන්නේ කැලෑවේ ගස්වැල් කියලා. එයාලා දැක්කා ලස්සනට තිබුණු කැලෑවට වෙලා තියෙන දේ. සුදු වලාකුළුවලට ගොඩක් දුක හිතුණා. සුදු වලාකුළු කළු වලාකුළුවලට කතා කළා. 'ඇයි ඔයාලා නිහඬ ව ඉන්නේ ? පහළ තිබෙන කැලෑවට වෙලා තියෙන දේ දැක්කෙ නැද්ද ?' කියලා ඇසුවා. ඒක අහලා කළු වලාකුළු කැලෑව දෙස බැලුවා. 'අපි කාලෙකින් කැලෑවට වැස්ස ලබා දුන්නේ නැහැ. අපි කළ යුතු දේ හරියට ඉටු කරලා නැහැ' කියලා කළු වලාකුළු දුක් වුණා. කළු වලාකුළු අහසේ පාවෙලා ඇවිත් ටිකෙන් ටික පරිසරය ම අඳුරු කළා. කැලෑවට වුණු විපත දැකලා කළු වලාකුළු ලොකු වැස්සක් ලබා දුන්නා. කැලෑවේ ගස්වැල්වලට හරි ම සතුටුයි. මැලවුණු පුංචි පැළවලටත් ටිකෙන් ටික පණ ආවා. කැලෑවේ ගස්වැල් ඔක්කොම එකතු වෙලා, එයාලට සතුටින් ඉන්න උදවු කළාට වලාකුළුවලට ගොඩක් ස්තුති කළා.